Article 13(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-12-12 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | එස්.පී. පැට්‍රික් මයා,<br>නො.1937/27, පොලිස් නිවාස,<br>කුමාරරත්නම් පාර,<br>කොළඹ 02. |
| වගඋත්තර පාර්ශවය | : | පො.ප.එච්.ඩබ්.එස්.සී. ජයලත් මහතා,<br>වැඩ බලන ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය,<br>වලස්මුල්ල. |

**<u>පැමිණිලි අංක : HRC/2675/12 – HRC/3406/12</u>**

පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකාර සෙනරත් පතිරණගේ පැට්‍රික් යන අය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටිනු ලබන්නේ, 2012.07.14 වන දින පැමිණිලිකරුගේ මව බැලීම සඳහා වලස්මුල්ල ප්‍රදේශයේ පිහිටි මවගේ නිවසට ගිය බවත්, එම නිවසට ගොස් එදින පැය 8.30ට පමණ කොළඹ බලා ආපසු පැමිණීමට පිටත් වූ බවත් ය. එම දින වලස්මුල්ල, ඕමාර පදිංචි එච්.පී.කරුණාදාස යන අය විසින් පැය 20.30ට පමණ අවි පෙන්වා පහරදීමක් සම්බන්ධව වලස්මුල්ල පොලිස් ස්ථානයට කරනු ලැබූවායයි කියනු ලබන පැමිණිල්ලක් මත කිසිදු විමර්ශනයකින් තොරව පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවත් කෙතරම් කරුණු ඉදිරිපත් කළද ඒ පිළිබඳව අවධානය යොමු නොකර තම මවගේ නිවස සෝදිසි කර තමාගේ තිල ඇඳුම් සහිත ඡායා රූපයක් ද රැගෙන ගොස් අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවත්, පසුව ව්‍යාජ චෝදනා ගොනු කර අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.**<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>**14, R. A. De Mel Mawatha, Colombo - 04.** | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනු ලබන්නේ උක්ත වගඋත්තරකරු විසින් සිදු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් සිදු කර ගැනීම වේ.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

වගඋත්තර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2012.07.14 වන දින රාත්‍රී පුල්ගහහේන, ඕමාර, වලස්මුල්ල පදිංචි සෙනරත් පතිරණගේ කරුණාදාස යන අයගේ නිවසට අයුතු ලෙස ඇතුළුවීම, ගිනි අවියක් පෙන්වා මරණ බවට තර්ජනය කිරීම, අතින්, පයින් සහ පොලු වලින් පහරදී දේපළ වලට අලාභානි කිරීම, අයුතු ජනරාශියක සාමාජිකයින් වීම යන කරුණු මත මෙම පැමිණිලිකරු වන සෙනරත් පතිරණගේ පැට්‍රික් යන අය අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව වලස්මුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත බීආර් 488/12 යටතේ සැකපිට ඉදිරිපත් කළ බවත් ය. මෙලෙස නිවසට ඇතුළු වී නිවැසියන්ව කාමරයකට දමා පහර දෙන බව හදිසි ඇමතුම් අංක 118 මගින් පණිවිඩයක් ලද බවත් එම පණිවිඩය ලද වේලාව 2012.07.15 වන දින අළුයම 00.10ට බවත් සඳහන් කර ඇත. මෙම පැමිණිලිකරුට අමතරව සෙනරත් පතිරණගේ ගයාන්, සෙනරත් පතිරණගේ පියදාස, සෙනරත් පතිරණගේ සමරවීර, ජයවික්‍රම ආරච්චිගේ ලලන්ත ප්‍රීති කුමාර, රුවන් චමින්ද හෙට්ටිආරච්චි, විදාන ආරච්චිගේ ඉසුරු අශේන්, අසංක මැදගේ හා බලංගොඩ පුතා යන අයවලුන් සම්බන්ධව ද විමර්ශනය කර අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :-

උක්ත පැමිණිලිකරු 1986 වර්ෂයේ සිට පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටි අයෙකු වන අතර අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කටයුතු කර ඇත. 2012.07.11 වන දින සිට 2012.07.15 වන දින දක්වා නිවාඩු ලබාගෙන පැමිණිලිකරුගේ මව බැලීම සඳහා වලස්මුල්ල, ඕමාර, ගොරකගහවත්ත නම් ප්‍රදේශයට ගොස් ඇති අතර 2012.07.14 වන දින උදෑසන වලස්මුල්ල නිවසේ සිට කොළඹ බලා පැමිණීමට පිටත්වූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. ඒ සඳහා පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත පහත සඳහන් සාක්ෂි ඉදිරිපත් කර ඇත.

1. පැමිණිලිකරු විසින් භාවිතා කරනු ලැබූ ජංගම දුරකථනයේ සවිස්තරාත්මක ලේඛනයක්.
2. කොම්පඤ්ඤවීදිය පොලිස් නිල නිවාස වල පදිංචිකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශය.
3. පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශය.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ජංගම දුරකථනයේ සවිස්තරාත්මක ලේඛනය පරීක්‍ෂා කිරීමේදී පැමිණිලිකරු විසින් භාවිතා කරනු ලැබූ ජංගම දුරකථනය 2012.07.12 වන දින හා 2012.07.13 වන දින වලස්මුල්ල ප්‍රදේශයේ සිට ක්‍රියාත්මක වී ඇති බවටද 2012.07.14 වන දින කොළඹ ප්‍රදේශයේ සිට ක්‍රියාත්මක වී ඇති බවට ද කරුණු අනාවරණය වේ. ඒ අනුව 2012.07.12 වන දින තම මව බැලීමට වලස්මුල්ල ප්‍රදේශයට ගිය බවටත් 2012.07.14 වන දින නැවත කොළඹ පැමිණි බවටත් පැමිණිලිකරු කරන ප්‍රකාශය නිවැරදි බව නිරීක්‍ෂණය වේ.

එසේම මෙම පැමිණිලිකරු විසින් 2012.07.14 වන දින පැය 20.53ට පමණ ද රුපින වීදියේ සිට පොලිස් සැරයන් ගුණසේන නැමැත්තෙකුට ඇමතුමක් ලබාගෙන තිබෙන අතර එදින පැය 20.14ට ජංගම දුරකථනයට ලැබී ඇති ඇමතුම අනුව ඒ වනවිට කොම්පඤ්ඤවීදියේ පැමිණිලිකරු සිටි බවට කරුණු තහවුරු වී ඇත. ඊට අමතරව පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිව්රුම් ප්‍රකාශයන් තුලින් ද පැමිණිලිකරු 2012.07.14 වන දින රාත්‍රී කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ සිටි බවට කරුණු අනාවරණය වී තිබේ.

වගඋත්තරකරු ප්‍රකාශ කරන පරිදි වලස්මුල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ල ලැබී ඇත්තේ හදිසි ඇමතුම් අංකය හරහා 2012.07.15 වන දින අළුයම 00.10ට වන අතර පොලිස් වාර්තා වලට අනුව පැය 22.30ට පමණ නිවැසියන්ට පහරදීම සිදුවී ඇති බවටත් කරුණු අනාවරණය වේ.

මෙලෙස පැමිණිලිකරු 2012.07.14 වන දින පැය 20.00ට පමණ කොළඹ ප්‍රදේශයේ සිටියේ නම් වලස්මුල්ල වැනි ප්‍රදේශයකට පැය 22.30ට වන විට නැවත යාමට හැකියාවක් නොමැති බව නිරීක්‍ෂණය වේ. පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේදී පැමිණිලිකරු මෙම සිද්ධියට සම්බන්ධයක් නොමැති බවට පැමිණිලිකරු සේවය කරනු ලැබූ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පවා කරුණු ඉදිරිපත් කළ ද වගඋත්තරකරු විසින් ඒ පිළිබඳ කිසිදු අවධානයක් යොමු නොකොට අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බව නිරික්ෂණය වේ පැමිණිලිකරු 2012.07.14 වන දින රාත්‍රී කොළඹ සිටි බව නිසි විමර්ශනයක් මගින් තහවුරු කර ගැනීමට හැකියාව තිබියදීත් වගඋත්තරකරු විසින් ඒ පිළිබඳ කිසිදු අවධානයක් යොමු නොකොට මුල් පැමිණිල්ලේ පැමිණිලිකරුගේ නම සඳහන්වීම මත ගිණි අවියක් රැගෙනවිත් තර්ජණය කිරීම යටතේ අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම සිදු කර තිබෙන බවට 2012.11.12 වන දාතමින් යුක්තව කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති වාර්තාවෙන් කියවෙන අතර සාධාරණ විමර්ශනයක් සිදු කළ බවට සාක්‍ෂි ඉදිරිපත්ව නොමැත.

තවද පැමිණිලිකරු නීති විරෝධී ලෙස සෙනරත් පතිරණගේ කරුණාදාස යන අයගේ නිවසට ඇතුළුවී ගිනි අවියක් පෙන්වා මරණ බවට තර්ජණය කර අතින් පයින් පහරදී අලාභහානි කළ බවට පොලිස් දෙපාර්තමේන්තුවට කරනු ලැබූ දැනුම්දීම මත වගඋත්තරකරු විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත. මේ සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව විසින් මෙම පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එම විනය පරීක්ෂණයෙන් පැමිණිලිකරු නිදොස් කර නැවත සේවයේ පිහිටුවා ඇති බවටද කරුණු අනාවරණය වේ. මෙලෙස පැමිණිලිකරුට එරෙහිව අධිකරණයට කරනු ලැබූ කරුණු වාර්තා කිරීම් එනම්. බී.ආර්.488/12 යන නඩුවට අදාලව චෝදනා ගොනු කිරීමට ද වගඋත්තරකරු අපොහොසත්ව ඇති බවත්, ඒ අනුව නඩු ගොනුව ගරු නීතිපති වෙත යොමු කර ඇති බවටත් කරුණු අනාවරණය වේ.

නිගමනය :-

ඉහත කරුණු අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සාධාරණ විමර්ශනයකින් තොරව, පැමිණිලිකරුට කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාවක් නොදී සිදු කර ඇති හෙයින් වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 13(1) වන ව්‍යවස්ථාවේ දක්වා ඇති "නීතිය නියම කළ ආකාරයට හැර කෙනෙකු අත්අඩංගුවට ගැනීම නොකළ යුතුය." යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

01. වගඋත්තරකාර පො.ප එච්.ඩබ්.එස්.සී ජයලත් මහතා විසින් පැමිණිලිකරු වෙත රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. මෙහි පිටපතක් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොලිස්පතිවරයා සහ පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2019.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 1. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07

සැ.යු - අදාළ මුදල් "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/